# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/13 – 2023 අගෝස්තු මස 07 වැනි සඳුදා – 2023.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/150.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.05.06 දිනැති හා අංක 2226/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, කොළමුන්න, අංක 25/බී/1 හි පදිංචි ජී. එච්. චානක මයා සහ කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, අංක 75 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.07.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

*නඩු අංකය:* A/49/2021.
IR/COM/01/2019/150.

1. ජී. එච්. චානක මහතා,
අංක 25/B/1,
කොළමුන්න,
පිළියන්දල,

එදිරිව

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,
අංක 75,
ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත,
කොළඹ 01.

කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් මා වෙත යොමු කරන ලද ආරාවුල වනාහී,

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සේවය කළ ජී. එච්. චානක මයාට ආයතනය තුළ දී සිදුවූ හදිසි අනතුරෙන් සිදුවී ඇති හානිය නොසලකා ඇඹිලිපිටිය ඔසුසලට ස්ථාන මාරුකිරීමෙන් හා පසුව ඔහු සේවය අතහැර ගියා සේ සැලකීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නීති නිළධාරිනී අනුරාධා විජේවර්ධන මිය, මානව සම්පත් අධ්‍යක්ෂක කල්පගේ මෙනවිය සහ නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන නීතිඥ මහතෙකු පෙනී සිටී.

වර්ෂ 1997.02.01 වන දින ඉහත සඳහන් ආයතනයේ සේවයට බැදී ඇත. 2017 ජූලි මස දක්වා සේවයේ නිරතව ඇත. 2017 ජූලි මස සංස්ථාව විසින් ඔහු සේවය අතහැර ගියා ලෙස සළකා සේවය අවසන් කර ඇත.

2013.10.31 දින සංස්ථාවේ විදුලි කාර්මිකයෙකු ලෙස සේවයේ යෙදී සිටියදී මුහුණ පෑ හදිසි අනතුරක් නිසා හිසට, වම් බාහුවට සහ කොඳුඇට පෙළට හානි සිදුවීම නිසා වසර 1 1/2 ක පමණ කාලයක් ප්‍රතිකාර ලබා ඇත. සේවයේ යෙදී සිටියදී සිදු වූ අනතුරක් හෙයින් ඉහත සඳහන් මාස 18 ක කාලය සඳහා ඔහුට වැටුප් සහ ප්‍රතිකාර සඳහා වැය වන මුදල සංස්ථාව මගින් ලබාදී ඇත. අනතුරෙන් වසර 1 1/2 කට පසු ඔහු නැවත සේවයට වාර්තා කර ඇත. එසේ වුවද කොඳුඇට පෙළෙහි ආබාධය දැඩි ලෙස තිබූ හෙයින් සංස්ථාවේ අනුග්‍රහයෙන් නැවත 2005.06.13 වන දින ශල්‍ය කර්මයකට භාජනය කර ඇත. ඉන්පසු නැවත මාස 5 කට පසු ශල්‍ය කර්මයකට භාජනය වීමට සිදුවී ඇත. දෙවන ශල්‍ය කර්මයෙන් පසු තරමක සුවයක් ලැබීම නිසා එවකට සිටි පාලන අධිකාරිය ඔහුගේ නිවසට ආසන්නව තිබූ සංස්ථාවට අයත් O.R.S. කර්මාන්ත ශාලාවට ලිහිල් සේවය සඳහා අනුයුක්ත කොට ඇති අතර එම ස්ථානයෙහි වසර 10 ක් සේවය කර ඇත.

එම කාලය අතර තුර 2009 දී ඔහු ඖෂධවේදී (බාහිර) විභාගය සමත්ව ඇත. ශාරීරික ආබාධිත තත්වය සැලකිල්ලට ගෙන ඔහු ඖෂධවේදී තනතුරට ඉල්ලුම් නොකලත් සංස්ථාවේ ඉල්ලීම (වාචික) පරිදි ඖෂධවේදී තනතුරට අදාළ පරීක්ෂණයට පෙනී සිට සමත් වූ නිසා සංස්ථාව වාචිකව ලබාදී ඇති පොරොන්දුව පරිදි පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව දැනට සේවය කරන ස්ථානයේම සේවය කිරීමට ඉඩ ලබාදිය යුතු වුවද, එය නොසලකා හැර සහකාර ඖෂධවේදියෙකු ලෙස 2016.12.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ 07 ඔසුසල ශාඛාව වෙත ස්ථාන මාරුවක් ලබාදී ඇත. සහකාර ඖෂධවේදියෙකු ලෙස පත්වීම ලබා දුන්නද විදුලි කාර්මිකයෙකු ලෙසද වරින් වර ඔහුගේ සේවය ලබාදීමට සිදුව ඇත.

ඖෂධවේදියෙකු ලෙස උසස්වීමක් ලැබුවද එම තනතුරට සාපේක්ෂිතව නව වැටුප වැඩිවන්නේ රු. 200/- ක් පමණ හෙයින්, තම රෝගී තත්වය නිසා පොදු ප්‍රවාහනයේ දිනපතා කොළඹ 07 ඔසු සලට යෑමට නොහැකි නිසා ආර්ථික හා කායික වශයෙන් සිදු වන අපහසුතාවය සළකා උසස්වීම අවලංගු කර පෙර තනතුරෙහිම පිහිටුවා තම නිවසට ආසන්න O.R.S. කර්මාන්ත ශාලාවේ සේවය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස 2017.02.13 දින ලිඛිතව සංස්ථාවට කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉන් අනතුරුව මාරුවීම ලබාදිය නොහැකි නම් අවම වශයෙන් රාත්‍රී සේවා මුරයෙන් නිදහස් කර දෙන ලෙස කළ ඉල්ලීමද සංස්ථාව ප්‍රතික්ෂේප කර ඇත. අසනීප තත්වය වෙනුවෙන් කළ නිවාඩු ඉල්ලීම් ද කළමනාකරු ප්‍රතික්ෂේප කර ඇත. තමාට හිමි නිවාඩු තිබියදී අසනීප නිවාඩු අයදුම් කළ අවස්ථාවේදී ඊට අනුමැතිය ලබා නොදීම නිසා එම වසරට ඔහුට ලැබිය යුතු ප්‍රසාද දීමනාවද ලැබී නොමැත.

තම සෞඛ්‍ය තත්වය දුර්වල බැවින් උසස්වීම නැවත අවලංගු කර විදුලි කාර්මික ලෙස පෙර සේවය කළ පිළියන්දල කම්හලට ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස කළ ලිඛිත ඉල්ලීමට සංස්ථාවෙන් නැවත වෛද්‍ය සහතිකයක් ලබාදෙන ලෙස කරන ලද දැනුම්දීමට අනුව මහාචාර්ය කොල්වින් ගුණරත්න මහතා හමුවී නියමිත පරීක්ෂාවන් සිදුකර 2007.03.11 දින වෛද්‍ය වාර්තාව ලබාදී ඇත. එයද සංස්ථාව මගින් ප්‍රතික්ෂේප කර ඇත්තේ ඒ වන විටද රත්මලාන බඩු ගබඩා පරිශ්‍රයේ පුරප්පාඩුවක් පවතිත්දීය.

කොළඹ 07 ඔසු සල ගබඩාවේ කළමනාකරු තමන්ට පහර දීමට තැත් කළ බව පවසා, එම සිද්ධිය නිසා ඉදිරියේදී තමන්ට ජීවිත තර්ජනයක් එල්ල වේ යැයි යන අනියත බිය නිසා වෙනත් ස්ථානයකට මාරුවක් ඉල්ලා 2017.04.05 දින කළ ලිඛිත ඉල්ලීමකට අනුව ඔහුට කොටුව ඔසු සල වෙතට මාරුවක් ලබා දී ඇත. එම ස්ථානයේ මාස දෙකක් පමණ හොඳින් සේවය කරත්දී ඇඹිලිපිටිය ඔසු සලට ස්ථාන මාරුවක් ලබා දී ඇති අතර වැටුප් වර්ධකයද වසරකට අත්හිටුවා ඇත. 2017.10.10 දින නැවතත් ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළද, එයද සංස්ථාව ප්‍රතික්ෂේප කර ඇත. 2017.08.03 දින සංස්ථාව විසින් සේවයට වාර්තා නොකිරීම නිසා සේවය අතහැර ගියා සේ සළකන ලිපියද යවා ඇත.

පළමු පාර්ශ්වය 2017.07.20 දින ලිඛිතව කළ ඉල්ලීම පරිදි කම්කරු දෙපාර්තමේන්තුව 2017.08.04 දින සිට 2019.03.07 දක්වා වරින් වර විමසීම් සිදුකර ඇත. 2019.03.19 දින නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ඒ. එච්. එස්. චන්ද්‍රිකා මහත්මිය දෙවන පාර්ශ්වය කැඳවා විසඳුමක් ලබාදීමට උත්සාහ කර ඇතත් දෙවන පාර්ශ්වය එයට නිසි ප්‍රතිචාර දක්වා නොමැත.

ඉන් අනතුරුව මෙම ආරාවුල බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇත.

**පෙනී සිටීම**

පළමු පාර්ශ්වය වෙනුවෙන් පැමිණිලිකරු වන පී. එච්. වානක මහතා පෙනී සිටි අතර ඔහු වෙනුවෙන් කිසිදු නියෝජිතයෙකු පෙනී සිටියේ නැත.

දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙනුවෙන් එම ආයතනයේ නීති නිලධාරිනී අනුරාධා විජේවර්ධන මහත්මිය සහ මානව සම්පත් ඒකකය වෙනුවෙන් කල්පගේ මෙනවිය පෙනී සිටියහ. නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නීතිඥ මහතෙකුද පෙනී සිටින ලදී.

**ප්‍රදානය**

පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය විසින් ප්‍රකාශ ඉදිරිපත් කොට ඇත. පළමු පාර්ශ්වය දැනුම්දී සිටිනුයේ තමා හදිසි අනතුරකට ලක්වූයේ රාජකාරියෙහි නිරතව සිටියදී බැවින් එම අනතුර නිසා කොඳු ඇට පෙළට සිදු වූ හානිය දිවි ඇති තුරු ආබාධිතව ජීවත්වීමට බලපා ඇති බවත්ය.

එක් සිද්ධියක් පාදක කොට නිසි ස්වාධීන පරීක්ෂණයකින් තොරව ඇඹිලිපිටිය ඔසු සලට මාරුකර යැවීම අසාධාරණ බවත් රෝගී තත්වය නිසා එතරම් දුරක ගොස් රාජකාරී කිරීම දුෂ්කර හෙයින් ස්ථාන මාරුව භාරනොගෙන පාලන අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කළද එයද අවධානයට නොගෙන සේවය හැර ගියා සේ සලකා සේවයෙන් පහ කිරීම ඊටත් වඩා අසාධාරණ ක්‍රියාවක් බවත්ය. ස්ථාන මාරුව අවලංගු කළහොත් නැවත රැකියාව කිරීමේ අපේක්ෂාව තිබුණද දැන් එයද ගිලිහී ගොස් ඇති බැවින් තමා විසින් ලිඛිතව ඉල්ලුම් කර ඇති සහනය බලධාරීන්ගෙන් ලබාදෙන ලෙසත්ය.

දෙවන පාර්ශ්වය පවසනුයේ ඔහුගේ ඉල්ලීම ඉටුකළ නොහැකි බවය. ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කර අවසන් තීරණය ලෙස ගෙන ඇත්තේ ඔහු අලුත් සේවකයෙකු ලෙස නැවත බඳවා ගැනීමට සහ ඔහුගේ පත්වීම ඇඹිලිපිටිය ඔසු සලට ලබාදීමටය.

**පසුබිම**

මෙම ආරාවුලට ආසන්නම හේතුව වූයේ ඇඹිලිපිටිය ඔසු සළට ලබාදුන් ස්ථාන මාරුව පැමිණිලිකරු විසින් ප්‍රතික්ෂේප කර එයට එරෙහිව සංස්ථාවේ පාලනාධිකාරියට ඔහු විසින් අභියාචනයක් ඉදිරිපත් කර තිබියදී එය විභාගයට නොගෙන සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම.

මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය හෙවත් පැමිණිලිකරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සේවයට බැඳී ඇත්තේ 1997.02.01 වන දින දීය. සේවයෙන් ඉවත් කරන තුරු පුරා වසර 20ක් ඉහත ආයතනයේ සේවය කර ඇත.
2003.10.11 වන දින විදුලි කාර්මිකයෙකු ලෙසින් සිය රාජකාරියේ නිරතව සිටියදී වහලෙන් බිම ඇද වැටීමෙන් හදිසි අනතුරකට ලක්ව ශල්‍යකර්ම 2 කට මුහුණපා ඇත. මෙම අනතුරෙන් වසර 1 1/2 කට පසු ඔහු නැවත සේවයට වාර්තා කර ඇත. රාජකාරි අවස්ථාවේදී සිදුවූ අනතුරක් නිසා සංස්ථාව මගින් එම කාලයට අදාළ වැටුප් හා ප්‍රතිකාර පහසුකම් ලබාදී ඇත. එසේ සේවයට වාර්තා කළ ඔහු නැවතත් රෝගීවීම නිසා 2005.11.09 දින කොඳු ඇට පෙළෙහි සැත්කමකට භාජනය වි ඇත. එම ශල්‍ය කර්මයෙන් පසු යම් සුවයක් ලැබුණද බර වැඩ කිරීමට බර ඉසිලීමට හෝ එකම ඉරියව්වකින් වැඩි වේලාවක් වැඩ කිරීමට නොහැකි හෙයින් එවකට සිටි පාලන අධිකාරිය ඉහත කරුණ සැළකිල්ලට ගෙන ඔහුගේ නිවසට ආසන්නව පිහිටි සංස්ථාවට අයත් ORS ඒකකයේ (ජීවනි ඔසු නිෂ්පාදන ඒකකය) සේවය සඳහා යොදවා ඇත. පුරා වසර 10 ක් එම ස්ථානයේ සේවය කර ඇති අතර එම කාලය තුල ඔහුගේ සේවය පිළිබඳ පාලනාධිකාරියෙන් කිසිදු චෝදනාවක් එල්ල කොට නොමැත.

ඉහත සේවයේ යෙදෙන අතර ඔහු 2009 වසරේදී ඖෂධවේදී (බාහිර) විභාගයට පෙනී සිටි සමත්ව ඇත. එසේ වුවද ඔහු ඖෂධවේදී තනතුරට උසස් කරන ලෙස ඉල්ලා නැත්තේ එම තනතුර ලැබීමෙන් පසු ඔසු සලකට සේවයට යාමට සිදුවන බැවිනි. තමා එවන් කාර්ය බහුල රාජකාරියකට සුදුසු සෞඛ්‍ය තත්වයෙන් පසු නොවන බව ඔහුගේ වැටහීම විය. එනමුත් කළමනාකාරීත්වයෙන් ඔහුට වාචිකව දැනුම් දී ඇත්තේ එම තනතුරට අයදුම් කරන ලෙසත් තනතුර ලැබීමෙන් පසුවද වෙනත් රාජකාරී සඳහා නොයවා එම ස්ථානයේම සේවය කිරීමට අවස්ථාව ලබාදෙන බවත්ය. එසේ පැවසුවද සංස්ථාව මගින් පවත්වන විභාගයෙන් සමත් වූ පසු සහකාර ඖෂධවේදියෙකු ලෙස කොළඹ 07 ඔසු සලට මාරු කර යවා ඇත.

තමාගේ සෞඛ්‍ය තත්වය මත ඔසු සලෙහි සේවය කිරීමට තරම් හැකියාවක් නොමැති බව තේරුම් ගෙන සහකාර ඖෂධවේදී තනතුරෙන් ඉවත් කර පෙර සිටි විදුලි කාර්මික තනතුරෙහිම පිහිටුවා රත්මලාන ORS කර්මාන්ත ශාලාවට අනුයුක්ත කර දෙන ලෙස ලිඛිතව ඉල්ලුම් කළද වත්මන් පාලනාධිකාරීන් එයටද අනුමැතිය ලබා දී නොමැත.

**ප්‍රදානය ලබාදීමේදී අවධානයට ලක් කරන ලද කරුණු**

පළමු පාර්ශ්වය වෙනුවෙන් පී.එම්. චානක මහතා සාක්ෂි ලබාදුන් අතර ඔහු වෙනුවෙන් වෙනත් කිසිදු නියෝජිතයෙකු පෙනී නොසිටියේය. දෙවන පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාවේ නීති නිලධාරිනිය සහ මානව සම්පත් කළමනාකරණ නිලධාරිනිය සාක්ෂි ලබා දුන්හ. නීතිපති දෙපාර්තමේන්තුව මගින් රජය වෙනුවෙන් නීතිඥ මහතෙකුගේ සහය ලබාදෙන ලදී. මෙම ආරාවුලට සෘජුවම සම්බන්ධ යැයි හැඟෙන කොළඹ 07 ඔසු සල කළමනාකරු කැඳවා සාක්ෂි විමසීම සිදු කරන ලදී.

ඉහත ආරාවුලට ප්‍රධාන හේතුව ලෙස දෙවන පාර්ශ්වය ඉස්මතු කර පෙන්වූයේ ජී. එච්. චානක මහතා (පළමු පාර්ශ්වය) තමා සේවය කරමින් සිටි ඔසු සල ශාලාවේ කළමනාකරුට පහර දීමක් සිදු කළ බවය.

මේ පිළිබඳව සිදු කළ විනය පරීක්ෂණ වාර්තාව ගෙන්වා මා හොඳින් අධ්‍යයනය කළෙමි. පහර කෑමට ලක්වූ බව කියන ශාඛා කළමනාකර කැඳවා සවිස්තරාත්මකව තොරතුරු ලබා ගතිමි.

ශාඛා කළමනාකරු පවසන ආකාරයට ඔහු පහර කෑමට ලක්වෙන දුටු කිසිම සාක්ෂියක් නොමැත.

CCTV කැමරා පද්ධතියක් ශාඛා ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම සිද්ධිය සිදුවූ දින CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක වී නොමැත. ඊට අදාළ උපාංග සහ නිරීක්ෂණ පද්ධතිය ඇත්තේ පහරකෑමට ලක්වූයේ යැයි කියන කළමනාකරුගේ නිල කාමරය තුළය. ඔහු පහර කෑමට ලක්වූ බව කියන දින CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක නොවීමෙන් ප්‍රශ්නාර්ථකාරී ගැටලුවක් වන්නේ සිද්ධියට පෙර දින හා පසු දින එම පද්ධතිය සාමාන්‍ය ආකාරයට ක්‍රියාකාරී වූ හෙයිනි.

කළමනාකරුගෙන් සාක්ෂි විමසීමේදී තමාගේ ගෙල සිර කල ආකාරය නිරූපනය කර පෙන්වන ලෙස ඔහුට අධිකරණය තුළදී දැනුම් දුනිමි. කළමනාකරු පැවසූ ආකාරයටත් ඔහු පෙන්වන ආකාරයටත් චානක නමැති ඖෂධවේදීයා ඔහුගේ ගෙල මිරිකා ඇත්තේ පිටුපයින් පැමිණය. කෙනෙකු පිටුපසින් පැමිණ ගෙල මිරිකන විට දැඩි අපහසුතාවයක් ඇතිවීම ස්වභාවිකය. එවන් අවස්ථාවකදී ඕනෑම පුද්ගලයෙකු ක්ෂණිකවම තමාට හැකි උපරිමය බලය යොදා ගෙළ තද කර ඇති අත්දෙක ඉවත් කර ගැනීමට උත්සාහ දැරීම ස්වභාවිකය. එසේ වුවද තම ගෙල තදින් මිරිකීමේදී ඉන් මිදීම සඳහා එවන් උත්සහයක් දරා ඇති බව නොපෙනේ. සිද්ධියෙන් පසු එම ස්ථානයට පැමිණි සේවිකාවක් පුලුන් කැබැල්ලක් ගෙන තොලෙහි තිබුණු දුටු ලේ බිඳක් පුලුන් කැබැල්ලක් තබා ප්‍රථමාධාරයක් ලබා දී ඇත. පෙට්ටි වැටෙන ශබ්දයක් මිස වෙනත් කිසිදු ශබ්දයක් නොඇසුණු බව සියලුම සාක්ෂිකරුවන් පවසති. ගබඩා කාමරය කුඩා හෙයින් පෙට්ටි තිසි ක්‍රමානුකූලව තැම්පත් කර නොමැති බව සාක්ෂිවලින් අනාවරණය විය. තදින් ගෙල සිර කිරීමකදී ඇතිවන මරණ බිය නිසා සිදුවන කම්පන තත්වයන් පිළිබඳව කිසිම සාක්ෂියකින් හෙලිදරව් නොවූ අතර ඒ පිළිබඳව නිරීක්ෂණයක්ද නොවීය. මෙවන් සිද්ධියකදී බාහිරව දැකිය නොහැකි වුවද අභ්‍යන්තර හානි සිදුවිය හැකි හෙයින් රෝහලකට යොමු වීම අත්‍යාවශ්‍ය කාර්යයක් වුවද එය සිදුකර නොමැත. පොලිස් ස්ථානයකට පැමිණිල්ලක්ද කර නොමැත. පෞද්ගලික රෝහලකින් ප්‍රතිකාර ගත් බවට තොරතුරු නොමැත.

තදින් ගෙල සිර කිරීමකදී ඇතිවන මරණ බිය නිසාම සිදුවන කම්පන තත්වයන් පිළිබඳ කිසිදු සාක්ෂියකින් තහවුරු කර නොමැත. අභ්‍යන්තර විනය පරීක්ෂණයකට කැඳවා ඇති කිසිදු සාක්ෂිකරුවෙකුගෙන් පහත සඳහන් කරුණු එකක්වත් තහවුරු වී නොමැත.

1. ඇසින් දුටු සාක්ෂි කිසිවක් නොමැත.

2. CCTV කැමරා පද්ධතිය එදින ක්‍රියා විරහිත වී ඇත. එය ඇත්තේ කළමනාකරුගේ අධීක්ෂණය යටතේ ඔහුගේ කාමරයේය.

3. ගෙල මිරිකීමකදී හෝ පහර දීමකදී ඇති වන කෑ ගැසීමක් කිසිවෙකුටත් ඇසී නැත.

4. ශාඛාවේ සේවය කරන අයට ඇසී ඇත්තේ පෙට්ටි පෙරළෙන ශබ්දය පමණක්ය. එවන් අවස්ථා එහි සිදුවන බව කළමනාකරුද පිළිගන්නා ලදී.

5. ගෙල සිර කිරීමක් හෝ පහරදීමක් පිළිබඳව කිසිදු ජීවී සාක්ෂියක් හෝ තාක්ෂණික සාක්ෂියක් නොමැත.

6. මෙම විනය පරීක්ෂණයේදී කිසිදු ඉහළ නිලධාරියෙකුගෙන් මෙම සිද්ධියට අදාළව කටයුතු කළ ආකාරය පිළිබඳව සාක්ෂි සටහන් කරගෙන නොමැත.

7. අභ්‍යන්තර විනය පරීක්ෂණයේදී අනාවරණය කරගත් කිසිදු කරුණු දැක්වීමකින් ජී. එච්. චානක යන අය කළමනාකරුට පහර දුන් බව හෝ ගෙල සිරකර ඔහුගේ ජීවිතයට හානියක් සිදුකිරීමට තැත් කළ බව හෝ තහවුරු කර නොමැත.

8. එවන් තත්වයක් යටතේ පී.එච්. චානක නමැති සහකාර ඖෂධවේදීයාට ඇඹිලිපිටිය ඔසු සලට වහාම ක්‍රියාත්මක වන පරිදි දඬුවම් ස්ථාන මාරුවක් ලබාදීම කිසිසේත් අනුමත කළ නොහැක.

9. තමා රාජකාරී කටයුත්තක නිරතව සිටියදී සිදුවූ අනතුරක් නිසා යථා තත්වයට පත්කළ නොහැකි ආබාධිත තත්වයකට පත්ව ඇත. එය තේරුම් ගත් එවකට සිටි පාලනාධිකාරය ඔහුගේ නිවසට ආසන්නම ස්ථානයක සහනදායි සේවයකට යොමු කිරීමෙන් පැහැදිලි වනුයේ එවකට සිටි පාලන අධිකාරිය තම සේවකයාට මානුෂික දෘෂ්ටි කෝණයකින් බලා කටයුතු කර ඇති බවය.

10. මෙම සේවකයා තම රෝගී තත්වය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කළ නිසා ඔහු තමාට ලැබුණු උසස්වීම අවලංගු කර ඊට පෙර සිටි විදුලි කාර්මික තනතුරට පත් කරන ලෙස කළ ඉල්ලීම වර්තමාන පාලන අධිකාරිය ප්‍රතික්ෂේප කර ඇත.

11. උසස්වීම භාරගන්නා ලෙසත් ස්ථාන මාරුව ලබා නොදෙන බවටත් පාලනාධිකාරය වාචිකව පොරොන්දු දී එය කඩ කර කොළඹ 07 ඔසු සල ශාඛාවට ඔහු ඊට එරෙහි නොවී එම පත්වීම බාරගෙන ඇත. සේවය සඳහා වාර්තා කර ඇත. මෙම සේවකයා පඩි රහිත නිවාඩු ලබා ඇති බවට දෙවන පාර්ශ්වය චෝදනා කළද එය අධිකරණයට ලබා දුන් ලේඛන මගින් තහවුරු කර නොමැත.

12. කායික පීඩාවන් නිසා තම ආයතනයට ලැබිය යුතු සේවාව යම් සේවකයෙකුගෙන් ලබාගත නොහැකි නම් පිළිගත් ක්‍රමවේදයක් අනුගමනය කර ඔහුට විශ්‍රාම ගැන්වීමට කටයුතු කළේ නම් සංස්ථාවට වඩා කාර්යශීලී පුද්ගලයෙකුගේ සේවය ඒ වෙනුවට ලබාගත හැක. එවන් විකල්ප ක්‍රියාමාර්ග තිබියදී එවන් කිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. පළමු පාර්ශ්වකරුගේ අභියාචනයෙන් පසු ඔහුට නැවත අලුත් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව පිළිගත් වෛද්‍ය විශේෂඥ මහාචාර්යවරයෙකුගේ පරීක්ෂණයට ලක්ව එම සහතිකයද ඉදිරිපත් කර ඇත. ඒ සියල්ල ප්‍රතික්ෂේප කර පළමු පාර්ශ්වකරු ඇඹිලිපිටිය ඔසු සලට වහාම ක්‍රියාත්මක පරිදි මාරු කිරීමට පාලනාධිකාරිය ගත් අත්තනෝමතික තීරණය කිසිසේත් නිවැරදි හෝ සාධාරණ නොවේ. එය තම සේවකයෙකුට එරෙහිව ගත් මානුෂිකත්වයෙන් බැහැර වූ තීරණයක් ලෙස සැලකිය හැක.

ඉතා සුළු සිද්ධියක් පාදක කොට නිසි පරිදි සිදු නොකර අභ්‍යන්තර විනය පරීක්ෂණය උපයෝගී කර ගනිමින් මීට පෙර ඔහු විසින් පෙර සිදුකළායැයි පවසමින් වෙනත් වැරදි ද ඉදිරිපත් කරමින් ද්වේෂ සහගත චේතනාවෙන් මෙම විනය පරීක්ෂණ වාර්තාව සකසා ඇති බව පැහැදිලිව පෙනේ.

අධිකරණය විසින් සියලු සාක්ෂි විමසීමෙන් අනතුරුව පළමු පාර්ශ්වයට ලබාදිය හැකි සහන පිළිබඳව නැවත සලකා බලා අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දෙවන පාර්ශ්වයට දැනුම් දුනිමි. එයට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය ගත් තීරණය ගරු අධිකරණයට ලිඛිතව ලබා දී ඇත. එහි සඳහන් වන්නේ මොහු අලුත් සේවකයෙකු ලෙසින් බඳවා ගත හැකි බවත් ඔහු සේවය කළ යුත්තේ ඇඹිලිපිටිය ඔසු සල ශාඛාවේ බවත්ය. අධ්‍යක්ෂක මණ්ඩලය සිය බලය අවභාවිතා කරමින් පළමු පාර්ශ්වය වන පී. එච්. චානක මහතාට එරෙහිව ගත් තීරණය පහත සඳහන් කරුණු මත ප්‍රතික්ෂේප කරමි.

සිදුවූ යැයි කියනු ලබන සුළු ආරාවුලට කිසිසේත් නොගැලපෙන තරම් බරපතල දඬුවමක් ලබාදීම.

තමා පෙර සේවය කළ පිළියන්දල ශාඛාවේ පවා එම අවස්ථාව වන විට පුරප්පාඩු තිබිය දී කිසිදු පුරප්පාඩුවක් වෙනත් ශාඛාවල නොමැති නිසා ඇඹිලිපිටියට ස්ථාන මාරුවක් දුන් බවට සාවද්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

විනය පරීක්ෂණයේ දී ජී.එච්. චානක මහතාට එරෙහිව නගා ඇති චෝදනා සැකයකින් තොරව ඔප්පු කිරීමට පාලනාධිකාරිය සමත් නොවීම.

තම රෝගී තත්වය නිසා නිසි පරිදි විශ්‍රාම ගන්වන ලෙස හෝ තම උසස්වීම ඉවත් කර පෙර සිටි විදුලි කාර්මික සේවයට නැවත පත්වීම ලබා දෙන ලෙස හෝ කළ ඉල්ලීම සංස්ථාව ප්‍රතික්ෂේප කිරීම 2019.03.14 දින පැවති සාකච්ඡාවට අනුව නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ඒ. එම්. එස්. චන්ද්‍රිකා මහත්මිය ඉදිරියේ සංස්ථාව වෙනුවෙන් සහභාගි වූ ආර්. කල්පගේ මෙනවිය එකඟ වී ඇත්තේ,

අපහසුතා සහිත බැවින් දුර පළාත්වලට මාරු කිරීමෙන් තොරව ප්‍රධාන කාර්යාලය හෝ රත්මලාන ශාඛා ඒකකයට හිඟ වැටුප් සහිතව සේවය පිහිටවන ලෙස හෝ ව්‍යවස්ථාපිත දීමනාවක් සමඟ සේවයෙන් විධිමත් ලෙස අස්වීම ලබා දීමට කටයුතු කරන බවත්ය. (පිටපත ඒ 12 ලෙසින් අමුණා ඇත.) ඉහත සඳහන් කරුණු පිළිබඳව 2019.04.15 ට පෙර තම ආයතනයේ තීරණය දැනුම් දෙන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව දැනුම් දුන්න ද සංස්ථාව එම එකඟත්වය කඩකරමින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන නිහඬ පිළිවෙතක් අනුගමනය කර ඇත. එමගින් පැහැදිලි වනුයේ සංස්ථාව පළමු පාර්ශ්වයේ ඉල්ලීම පිළිබඳ කිසිදු තැකීමක් සිදු කර නොමැති බවය.

ඉන්පසු කම්කරු දෙපාර්තමේන්තුව කළ කැඳවීම්වලටද සහභාගි වී නොමැත. ඉහත සඳහන් කරුණු සියල්ල සැලකිල්ලට ගෙන ජී. එච්. චානක මහතාගේ සේවය අවසන් කළ අප්‍රේල් 30 (නඩුව අවසන් කළ මාසය) දක්වා ඔහුට ගමන් දීමනා හැර හිමි හිඟ වැටුප් හා පාරිතෝෂික දීමනා ඇතුළු සියළු ව්‍යවස්ථාපිත දීමනා ලබා දෙන ලෙසත් නියෝග කරමි. මෙම හිඟ වැටුප් ගෙවීමේදී 2017 වසරේ අවසාන වරට ඔහු ලබා ගත් මාසික වැටුප පදනම් කරගෙන ගණනය කිරීම් සිදු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. එම ගණනය කිරීම් පහත දැක්වේ.

ජී.එච්. චානක මහතා යළි ප්‍රකෘති තත්වයට පත් කළ නොහැකි බව වෛද්‍ය වාර්තා හා ඔහුට සිදුකරන ලද ශල්‍යකර්මවල තොරතුරු අනුව මනාව පැහැදිළි වන හෙයින් එවන් ආබාධයක් නොවේ නම් ඔහුට සිය වයස අවුරුදු 55 දක්වා සේවය කළ හැකි බවට උපකල්පනය කරමින් ඉදිරිපත් කර ඇති ඔහු අපේක්ෂිත වන්දි මුදලෙන් ගමන් දීමනා හැර මෙම නඩුව අවසානයේ 2022 අප්‍රේල් 30 වන දිනට වලංගු වන පරිදි වන්දි මුදල ලබාදීම සුදුසු යැයි අධිකරණය විශ්වාස කරන හෙයින් මෙම ආරාවුල සමතයකට පත්කිරීමේ අරමුණින් 2022 ජනවාරි 03 වන දින අධිකරණයේදී මා විසින් දෙවන පාර්ශ්වයට ලබාදුන් නියමයන්ට අනුව සමථයකට පත්වීම සඳහා කැමැත්ත පළකරමින් 2022 ජනවාරි 26 වන දින එවන ලද ඒ/49/2021 බේරුම්කරණ නඩු ලිපිගොණුවෙහි පිටු අංක 52 ලෙසින් ගොනුවී ඇති ලිපියේ සඳහන් ආකාරයට ගමන් දීමනා රහිතව 2022 අප්‍රේල් 30 දක්වා බලපාන පරිදි රු. 1946177.60 ක මුදල මෙම බේරුම්කරණ නඩුවේ පළමු පාර්ශ්වය වන ජී. එච්. චානක මහතාට ලබාගත හැකි වන පරිදි මෙම නියෝගය *ගැසට් පත්‍රයෙහි* පළ කරන දිනයේ සිට දින 14 ක් ඇතුළත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැම්පත් කරන ලෙසට මෙයින් නියම කරමි.

ලබා දී ඇති අනෙකුත් සහනයන් මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකරන දිනයේ සිට මසක් ඇතුළත ක්‍රියාත්මක කර ඒ බව දකුණු කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර කොමසාරිස් වෙත දැනුම් දිය යුතු බවට මෙයින් නියම කරමි.

පළමු පාර්ශ්වයට හිමි සේවක අර්ථසාධක හෝ අනෙකුත් ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවන බව සැලකිල්ලට ගත යුතුය.

ඉහත සඳහන් තීරණ සාධාරණ හා යුක්ති සහගත තීරණයන් බවත් ඉතා හොඳින් අපක්ෂපාතීව කරුණු විමසා බැලීමෙන් අනතුරුව ගත් තීරණ බවත් සටහන් කරමි.

බේරුම්කරු

2023 ජූලි මස 10 වැනි දින.

EOG 08 - 0078

මගේ අංකය: IR/COM/03/2019/91.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.14 දිනැති හා අංක 2314/88 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මතුගම, මහ කළුපහන, ලිහිණියාව හි පදිංචි කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මයා සහ කොළඹ 03, ගාලු පාර, අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල හි පිහිටි ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.07.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දීය**

ගොනු අංකය - IR/COM/03/2019/191.
බේරුම්කරන නඩු අංකය - A/10/2023.

කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම්,
ලිහිණියාව,
මහ කළුපහන,
මතුගම,

*ඉල්ලුම්කරු*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
අංක 411,
ගාලු පාර,
කොළඹ 03.

*වගඋත්තරකරු*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව ඔහුවෙත පැවරී ඇති බලතල අනුව මෙකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා පත් කොට ඇත,

**යොමුව**

කම්කරු කොමසාරිස් ජනරාල් ගේ 2022.12.28 දිනැති යොමුව ලෙස කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මහතාට ආදායම් නිලධාරී තනතුර හිමි ද හිමි නම් ඒ කවර කාලයක සිටද? හිමි විය යුතු සහන කවරේද යන්නත් සහ 2001.01.01 දින සිට III වන ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට පත් කිරීමෙන් කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මහතාට එම පත්වීම ශ්‍රේණිගතව ලබා දීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? එසේනම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.

අදාළ බේරුම්කරණ ක්‍රියාවලියේදී ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් එම්. කේ. හේමපාල, ග්‍රේෂන් සිල්වා යන අයද වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරි කුෂාණි ජයසුන්දර, හිරුණි ද අල්මේදා සමග මානව සම්පත් විධායක එම්. එම්. ටී. බණ්ඩාර යන අය ද පෙනී සිටින ලදී.

මෙම ආරාවුලට අදාළ ඉල්ලුම්කාර පාර්ශ්වය පළමු පාර්ශ්වය යනුවෙන්ද වගඋත්තරකාර පාර්ශ්වය දෙවන පාර්ශ්වය යනුවෙන්ද මින් මතු සඳහන් කරනු ඇත.

**ආරාවුලේ පසුබිම**

ඉල්ලුම්කරු ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ බිල්පත් නිලධාරි තනතුරට පත්කර ඇති අතර සියයට එකකට වඩා වැඩි විදුලි මනු කියවීම් වාර්තා පැවතීම ප්‍රමුඛ තවත් හේතු නිසා අවස්ථා ගණනාවකදී පරිවාස කාලය දීර්ඝ කර ඇත. වැටුප් වර්ධක විලම්බනය කිරීම් සිදුකර ඇත. බාහිර පුද්ගලයෙකු ලවා ඉල්ලුම්කරුට එරෙහිව විනය පරීක්ෂණයක්ද පවත්වා තිබේ. පසුව බිල්පත් නිලධාරි තනතුරට ඉහලින් ඇති ආදායම් නිලධාරි තනතුරට 2001.01.01 දින ඔහු පත් කර තිබේ.

බිල්පත් නිලධාරි තනතුර දරද්දී ලබාදී ඇති පරිවාස කාලය දීර්ඝ කිරීම්, වැටුප් විලම්බනය කිරීම්, ආදියට අදාළව තමාට සාධාරණයක් ඉටුව නැති බව ඉල්ලුම්කරු පවසන අතර නිසි කලට ආදායම් නිලධාරි තනතුර ලබා දී නැති බවද තමා ආදායම් නිලධාරි තනතුරේ III වන ශ්‍රේණියට පත්කර තිබීම දෝෂ සහගත බවද තමා පත්කළ යුතුව තිබුණේ පස්වන ශ්‍රේණියට බවද පවසයි. තමා වෙනුවෙන් සාධාරණය ඉටුකර හිගවැටුප් දීමනා ආදිය ලබා දෙන ලෙස ඔහු අයැද සිටියි.

**තීන්දු ප්‍රකාශය ලබා දීමේදී සළකා බලා ඇති කරුණු**

බේරුම්කරණය විභාගයට ගැනීමට පෙර කම්කරු කොමසාරිස් ජනරාල් වරයා සිදු කරන ලද ලිඛිත ඉල්ලීම පරිදි පළමු පාර්ශ්වය ආරාවුල සම්බන්ධයෙන් වන ප්‍රථම කරුණු දැක්වීම 2023.02.23 දාතමින් සිදු කර තිබේ.

කම්කරු කොමසාරිස් ජනරාල් වරයා සිදු කරන ලද ලිඛිත ඉල්ලීම පරිදි ආරාවුල සම්බන්ධයෙන් වන ප්‍රථම කරුණු දැක්වීම දෙවන පාර්ශ්වය හෙවත් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ නීති සහ පරිපාලන කළමණාකරු නීතිඥ කේ. ඒ. එස්. එල්. කුරුප්පුආරච්චි යන අයගේ අත්සන සහිතව 2023.02.23 දාතමින් ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශ්වයේ දෙවන ප්‍රකාශය ඔහුගේ බලයලත් නියෝජිත පී. ඩබ්. ග්‍රේෂන් ද සිල්වා විසින් 2023.03.23 දින ඉදිරිපත්කර ඇත. මීට අමතරව පළමු පාර්ශ්වය 2023.03.02 දාතමින් මූලික සාක්ෂි දිව්රුම් ප්‍රකාශය නමැති ලියවිල්ලක්ද ඉදිරිපත් කර තිබේ.

දෙවන පාර්ශ්වයේ දෙවන ප්‍රකාශය එහි නීති සහ පරිපාලන කළමණාකරු නීතිඥ කේ. ඒ. එස්. එල් කුරුප්පුආරච්චි යන අයගේ අත්සනින් 2023.02.23 දාතමින් අදිරිපත් කර ඇත.

පළමු පාර්ශ්වය 2023.06.15 දරන සිය ලිඛිත දේශණය මගින් අධිකරණයෙන් ඉල්ලා සිට ඇත්තේ 2023.03.02 දාතමින් ඉදිරිපත් කර ඇති මූලික සාක්ෂි දිව්රුම් ප්‍රකාශය නමැති ලියවිල්ලේ 1 සිට 6 දක්වා ඉල්ලා ඇති සහනයන් ලබාදෙන ලෙසය,

**එම ඉල්ලීම් වන්නේ**

I 1991.06.01 දින සිට ආදායම් නිලධාරි තනතුරේ පිහිටුවන ලෙස

II 1991.06.01 දින සිට ඒ 5 වැටුප් ශ්‍රේණියේ පිහිටුවා හිය වැටුප් හා දීමනා ගෙවන ලෙස

III 1996 සිට විලම්බනය කර ඇති වැටුප් වැටුප් වර්ධක යළි ගෙවන ලෙස

IV සෙසු ආදායම් නිලධාරීනට මේ වන විට ගෙවන වැටුප් හා ශ්‍රේණි මාහට ද ලබා දෙන ලෙස

V 2020 වසරේ සිට සෙසු ආදායම් නිලධාරීනට චක්‍රලේඛ ප්‍රකාර ගෙවන ඒ 9 ශ්‍රේණියේ වැටුප් ගෙවන ලෙසට

VI ඉහත සියලු ගෙවීම් වලට අදාළව ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවන ලෙස

1. 1991.06.01 දින සිට ආදායම් නිලධාරි තනතුරේ පිහිටුවන ලෙස කරන ඉල්ලීම

දෙවන පාර්ශ්වය එකී අංක 1 දරන කරුණ සම්බන්ධයෙන් ඉල්ලා ඇති සහනය ලබා දිය හැකිද යන්න විමසිල්ලට භාජනය කරන ලදී.

දෙවන පාර්ශ්වය සිය ප්‍රථම ප්‍රකාශයෙන් දක්වන පරිදි (ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට් ලිමිටඩ් සමාගම) නිකුත් කර ඇති එඩීඑච්/පීඑෆ්/කේ 73 සහ 1989 ජුනි 01 දින දරන ලිපිය මගින් පළමු පාර්ශ්වය වසර දෙකක කොන්ත්‍රාත් පදනම යටතේ පුහුණුවන

බිල්කරු තනතුරකට බඳවාගෙන ඇති අතර එම පත්වීම් ලිපියේ 03 වන ඡේදය මගින් එම පත්වීම මාස 6 ක පරිවාස කාලයකට යටත් කර තිබේ. (ආර් 1)

පළමු පාර්ශ්වය අදාළ සේවයේ නිරත නොවීම යන කරුණ දක්වා දෙවන පාර්ශ්වය නිකුත් කළ 1990.04.30 දාතමැති ලිපිය මගින් එකී පරිවාස කාලය 1990.05.31 දින දක්වා දීර්ඝ කර ඇත. (ආර් 2)

1989.12.01 සිට 1990.05.31 දක්වා කාලයට අදාළ කාර්ය සාධන වාර්තාව අනුව සියයට 2.6 (දෙකයි දශම හයක) බිල්පත් වැරදි වාර්තා වී තිබීම නිසා තවත් හය මසකින් පළමු පාර්ශ්වයේ පරිවාස කාලය දීර්ඝ කරන බව දෙවන පාර්ශ්වය නිකුත් කර ඇති 1990.10.10 ලිපියෙන් යළිත් දන්වා ඇති අතර සේවා තත්වය යහපත් අතට හරවා ගන්නා ලෙසද එමගින් අවවාද කර ඇත. (ආර් 3)

1990. 10.10 දාතමින් පළමු පාර්ශ්වය වෙත භාරදී ඇති ලිපියටද අවධානය යොමු කරමින් 1991.04.26 දිනැති තවත් ලිපියක් දෙවන පාර්ශ්වය නිකුත් කර ඇති අතර පරිවාස කාලය දීර්ඝ කර ඇති 1990.06.01 සිට 1990.11.30 දින දක්වා කාලයට අදාළ බිල්පත් නිකුත් කිරීම පිළිබඳ වාර්තාවන් අනුව ඊට අදාළ වැරදි ප්‍රමාණය සියයට 2.6 (දෙකයි දශම හයක්) වී ඇති බව අනාවරණය වී ඇති හෙයින් පළමු පාර්ශ්වයේ පරිවාස කාලය අවසන් වශයෙන් 1991.05.31 දින දක්වා දීර්ඝ කරන බව දක්වා තිබේ. දීර්ඝ කරන ලද පරිවාස කාලය තුළදී පැමිණීම සහ සේවා කටයුතු සතුටුදායක නොවන්නේ නම් පළමු පාර්ශ්වය වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපියේ 10 වැනි වගන්තිය ප්‍රකාරව සේවය අවසන් කරන බවට තදින් අවවාද කිරීමක්ද එමගින් සිදු කර ඇත. (ආර් 4)

2023.03.28 දින පැවති දෙවැනි පාර්ශ්වයේ හරස් ප්‍රශ්ණ විමසීමේදී පළමු පාර්ශ්වය අතින් රාජකාරි වැරදි සිදුව ඇති බව පැහැදිළිව ඇති අතර 2023.05.15 දින ලබාදෙන ලද දෙවන පාර්ශ්වයේ මානව සම්පත් විධායක එම්. එම්. ටී. බණ්ඩාර යන අයගේ සාක්ෂිවලින්ද පළමු පාර්ශ්වයේ රාජකාරිමය දුර්වලතා මනාව පැහැදිළිව ඇත.

පළමු පාර්ශ්වය අධිකරණය හමුවේ ඔප්පුවනු පිණිස ඉදිරිපත්කර ඇති 2023.03.02 දාතමැති මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයෙන් තමා වෙත පැවරී ඇති මනු අංක කියවීමේ රාජකාරිය හරියාකාරව ඉටු කිරීමට නොහැකිව ඇත්තේ කුමන දුෂ්කරතා නිසාදැයි පැහැදිළි කර ඇති අතර මතුව ඇති එම දුෂ්කරතා දක්වා ඇති ඡේද කිහිපයක් යට දක්වා තිබේ.

09. මුල් කාල පරාසය තුළ මනු කියවීමේදී බොහෝ අසීරුතාවයනට මුහුණ දීමට සිදු වූයේ පැරණි මනු දුර්වර්ණ වීමත් පහසුවෙන් කියවීමට සුදුසු ස්ථානවල මනු සවිකර නොතිබීමත් සමහර නිවාස වල සුනඛයිනට නිදැල්ලේ හැසිරීමට ඉඩ දීමත් වැනි අපහසුතා නිසා බවද එක් අවස්ථාවකදී සුනඛයින් තිදෙනකු විසින් සපා කෑම තුලින් මා බරපතල ලෙස රෝගී තත්වයට පත්ව රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගැනීමට සිදු වූ බවත්

10. ඊට අමතරව දේශගුණික තත්වයද තදින් බලපෑ අතර අධික වර්ෂාව සහ පාරවල් ජලයෙන් යට වීමත් ඒ ඒ පාරිභෝගික ස්ථානද ජලයෙන් යටවීමත් මඩ සහිත ස්ථාන කරා ලගාවීමට තිබූ අපහසුතාත්, අධික සූර්ය රශ්මිය මත මනු කියවීමට ඇති අසහසුවත් ඇස්මට්ටමට ඉහලින් මනු සවි කර තිබීම ආදී අපහසුතා මැද මීටරය කියවීමේදී '0' හය වගේ පෙනෙන අවස්ථා '6' අට වගේ පෙනෙන අවස්ථා නිසා ඒ ඒ මාසවල මනු ඒකක ගණන නිවැරදිව සටහන් වූයේ නැති බවත් ඊලග මස එය නිවැරදි වන අතර එම තත්වය මා හට පමණක් නොව බොහෝ මනු කියවන්නන්ට මුහුණ දීමට සිදුවූ බවත් ඒ සම්බන්ධව පැවති පරීක්ෂණ වලදී අනාවරණය වූ බවත් සැළ කර සිටියි.

වැසි සහිත කාලගුණය, මඩ සහිත බව, සූර්ය රශ්මිය වැනි කාරණා පළමු පාර්ශ්වයට පමණක් බලපාන සුවිශේෂ කරුණු නොවන හෙයින් ද මාස ගණනාවක් පුරාවට මෙවන් තත්වයක් පවතින බව පැවසීම විමතියට කරුණකි. විදුලිය මනු කියවීමේ රාජකාරිය සාර්ථක ලෙස ඉටු කිරීමට දිගින් දිගටම ඔහු අපොහොසත්ව ඇත. අදාළ කාල පරිච්ඡේදය තුළ යථා පරිදි තමා සේවයේ යෙදී ඇති බව ඔප්පු කරන්නට පළමු පාර්ශ්වය සමත්ව නැත.

එම හේතු සාධක අනුව 1991.06.01 දින සිට පළමු පාර්ශ්වය ආදායම් නිලධාරී තනතුරට පත්කළ හැකි වටාපිටාවක් පවා සකස්ව නොමැති බව පැහැදිළිය. එහෙයින් අංක 1 දරන එම ඉල්ලීම පිළිගැනීමට ප්‍රමාණවත් හේතු සාධක නොමැති බවට තීරණය කරමි.

11. 1991.06.01 දින සිට ඒ 5 ශ්‍රේණියේ පිහිටුවා හිඟ වැටුප් හා දීමනා ගෙවන ලෙස කරන ඉල්ලීම

අංක 1 ඉල්ලීම ඉටුකළ හැකි නොවන හෙයින් 1991.06.01 දින සිට ඒ 5 වැටුප් ශ්‍රේණියේ පිහිටුවා හිඟ වැටුප් ලබා දෙන ලෙස කෙරෙන 11 වන ඉල්ලීම ඉටු කළ නොහැකි තත්වයක් උද්ගත වෙයි.

111. 1996 සිට විලම්බනය කර ඇති වැටුප් වර්ධක යළි ගෙවන ලෙස කරන ඉල්ලීම

පළමු පාර්ශ්වය වෙත 1996.01.01 දිනට ගෙවීමට නියමිත වැටුප් වැඩිවීම සළකා බැලීම පිණිස ලබාගෙන ඇති වාර්තාවේ 1994.10.01 දින සිට 1995.09.30 දින දක්වා බිල්පත් නිකුත් කිරීමේදී සිදුව ඇති වැරදි සංඛ්‍යාවේ ප්‍රතිශතය 1.24(එකයි දශම දෙකයි හතර වීම හේතුවෙන් එම පාර්ශ්වයේ වැටුප් වැඩිවීම වසරක කාලයකට විලම්බනය කර ඇත.(ආර් 5)

පළමු පාර්ශ්වය වෙත 1997.01.01 දිනට ගෙවීමට නියමිත වැටුප් වැඩිවීම සළකා බැලීම පිණිස ලබාගෙන ඇති ප්‍රගති වාර්තාවෙහි ඔහුගේ වැඩ, පැමිණීම සහ හැසිරීම වැඩි දියුණු කළයුතු බවට වාර්තා වී ඇති අතර වසරකට දෙවරක් බැගින් ලබාගත් සියයට එකකට වැඩි විදුලිය බිල්පත් වැරදි සහිත වාර්තාවක් ද එහි දක්වා ඇත. එම ලිපිය මඟින් 1997.01.01 ට නියමිත වාර්ෂික වේතනාධිකය ගෙවීමද විලම්බනය කරන බැව් දන්වා තිබේ. බිල්පත් වැරදි සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට එකට වඩා වැඩිවීම පිළිබඳව විනයානුකූල පියවරක් නොගතයුත්තේ මන්ද යන්න දන්වන ලෙසද 1997.06.06 දින දරන එම ලිපියෙන් දැනුම් දී ඇත. (පාර් 6)

දෙවන පාර්ශ්වය නිකුත් කළ 1997.06.06 දිනැති ලිපියට පිළිගත හැකි පිළිතුරක් නොසැපයීම නිසා සාවද්‍ය බිල්පත් නිකුත්කිරීම යටතේ චෝදනා 4 ක් නගා පළමු පාර්ශ්වයට එරෙහිව බාහිර පරීක්ෂණ නිලධාරියකු ලවා විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව 1997.11.12 දින දරන ලිපියෙන් දන්වා තිබේ. (ආර් 7)

එම විනය පරීක්ෂණයේදී පළමු පාර්ශ්වයට එරෙහිව නගා තිබූ චෝදනා සියල්ලටම වරදකරු වී ඇති බව පරීක්ෂණ නිලධාරියා දන්වා ඇත. සියයට එකේ සීමාව ඉක්මවා බිල්පත් නිකුත් කිරීම් වැරදි වලට අදාළව අවස්ථා ගණනාවකදී පළමු පාර්ශ්වයට එරෙහිව කටයුතු කර ඇති හෙයින් ද වසර 9 ක පමණ සේවා කාලය සළකා බැලීමෙන් ද අනතුරුව මෙය අවසන් වතාව සේ සළකා තවදුරටත් සමාගමේ සේවය කිරීමට අවස්ථාව ලබා දීමට තීරණය කර ඇති බැව් 1998.10.12 දින දරන ලිපියෙන් දන්වා ඇත. බිල්පත් වැරදි ප්‍රමාණය සියයට 1 කට අඩු කරගැනීමට සිතට ගන්නා ලෙසද එමගින් තවදුරටත් දැනුම් දී තිබේ. (ආර් 8)

1998.01.01 දිනට අදාළ වැටුප් වර්ධකය ලබාදීම සඳහා 1997.01.01 සිට 1997.12.31 කාලයට අදාළව පළමු පාර්ශ්වය නිකුත්කර ඇති විදුලි බිල්පත් වැරදි සංඛ්‍යාව සළකා බැලීමේදී එය සියයට එකේ සීමාව ඉක්මවා ඇති නිසා එම වසරට අදාළ වාර්ෂික වේතනාධිකයද විලම්බනය කර ඇත. (ආර් 9)

1998.01.01 සිට 1998.12.31 ට අදාළව පළමු පාර්ශ්වයට අදාළව කැඳවා ඇති කාර්ය ඇගයීම් වාර්තාව අනුව ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම අපේක්ෂා කරන ප්‍රගතිය ඔහු දක්වා නොමැති බව 1999 මැයි 13 දිනැති ලිපියෙන් දන්වමින් පහත සඳහන් පැහැදිළි කිරීම් එම සමාගමේ පිරිස් කළමණාකරු විසින් සිදුකර තිබේ.

1 අවධාරණයෙන් කිරීම හා වේගය ප්‍රමාණවත් නැත.
(සමහරවිට මීට වඩා කාර්යය හොඳින් කළ යුතු යැයි කියාදිය යුතුය. පුද්ගලික වැඩ කටයුතු සඳහා සෑහෙන කාලයක් ගත කරයි. වැඩට අවධානය යොමු කරනුයේ උනන්දු කළ විට පමණි. වැඩ ප්‍රමාදයි. හීන නිපැයුමක්, වැඩ අතපසු කරයි. රැකියාවේ අවම ප්‍රමාණය ඉටු කරයි.)

2 නිරවද්‍යතාවය හා විශ්වාසවන්ත භාවය ප්‍රමාණවත් නැත.
(තරමක් දුරට කටයුතු කරන්නෙකි. වැඩ නිතර පරීක්ෂාවට ලක් කළ යුතුය. හොඳට වැඩ කළයුතු බව ඉඳහිට මතකයට පත්කළ යුතුය.)

3 කලට පැමිණීම හා වැඩට පෙනී සිටීම ප්‍රමාණවත් නැත. (ඉඳහිට ප්‍රමාදව පැමිණෙයි)

4 1998.01.01 සිට 1998.12.31 දින දක්වා කාලය තුළ බිල්පත් නිකුත් කිරීමේදී සිදුකර ඇති වැරදි සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට එකයි දශම බිංදුවයි නමයකි.

මේ හේතු නිසා 1999.01.01 දිනට යෙදී තිබූ පළමු පාර්ශ්වයේ වැටුප් වර්ධකය මාස 6 ක කාලයකට අත්හිටුවන බව දන්වා ඇත. (ආර් 10)

(එම මාස 6 ට අදාළව) 1999.01.01 සිට 1999.05.31 දින දක්වා සේවා කාලය වෙනුවෙන් කැඳවා ඇති කාර්ය ඇගයීම් වාර්තාව අනුව නිරවද්‍යතාවය හා විශ්වාසවන්තභාවය ප්‍රමාණවත් නැති බවත් කලට පැමිණීම හා වැඩට පෙනී සිටීම ප්‍රමාණවත් නැති බවත් දන්වා ඇති අතර 1999.01.01 දිනට යෙදී තිබුන පළමු පාර්ශ්වයේ වැටුප් වර්ධකය තවත් මාස 6 ක කාලයකට අත්හිටුවා ඇති බව 1999.11.08 දින නිකුත් කළ ලිපියෙන් දන්වා ඇත. (ආර් 11)

1999.01.01-1999.12.31 කාලයට අදාළව කැඳවා ඇති ඇගයීම් වාර්තාව අනුව වසරේ දෙවන මාස 6 තුළ දී පළමු පාර්ශ්වය බිල්පත් නිකුත් කිරීමේදී සිදුකර ඇති වැරදි සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 1 ඉක්මවා තිබීම නිසා 2000.01.01 දිනට යෙදී තිබූ වැටුප් වර්ධකය නතර කරන්නට දෙවැනි පාර්ශ්වය 2000 ජුනි 08 දාතමින් නිකුත් කර ඇති ලිපියෙන් කටයුතු කර ඇත. ඉදිරි කාලයේදී සතුටුදායක ප්‍රගතියත් ඇති කරගන්නා ලෙසද තවදුරටත් එමගින් අවවාද කර තිබේ. (ආර් 12 )

2023.05.15 දින පවත්වන ලද නඩු විභාගයේදී දෙවන පාර්ශ්වයේ මානව සම්පත් විධායක එම්. එම්. ටී. බණ්ඩාර නමැති අය මෙසේ සාක්ෂි ලබා දුන්නේය.

ප්‍රශ්: එමෙන්ම සාක්ෂිකරු ආර් 5 ලෙස නම් කර ඇති ලේඛනය පරීක්ෂා කර අධිකරණයට පැහැදිලි කිරීමක් කරන්න.

පිː 1996.01.01 දිනට නියමිත වාර්ෂික වැටුප් වැඩිවීම ලබා දී නැත්තේ ඔහුගේ බිල්පත් වැරදි සංඛ්‍යා ප්‍රතිශතය සියයට එකයි දශම දෙකයි හතරක් බව වාර්තාවෙලා තිබෙන නිසා.

ප්‍රශ්: මෙම ආර් 6 ලේඛනය මගින් ඉල්ලුම්කරුගේ වාර්ෂික වැටුප් වැඩිවීම වර්ෂයක කාලයකට විලම්බනය කිරීමට හේතුව ලෙස කුමක් සඳහන් කර තිබෙන්නේද?

පිː ආර් 6 ලේඛනයේ සඳහන් කරල තිබෙන්නේ පැමිණීම සහ හැසිරීම වැඩි කරගත යුතු බවට ඒ වගේම බිල්පත් වැරදි සඳහන් කරල තිබෙනවා. ඒ අනුව එම වර්ෂයට අදාළ වාර්ෂික වැටුප් වැඩිවීම විලම්බනය කරල තිබෙනවා ( 3 සහ 4 පිටු)

එදින සාක්ෂි දීමේදී තවත් අවස්ථාවක ආර් 7 ලෙස සළකුණු කර ඇති ලේඛනයකට අදාළව දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු වන මානව සම්පත් විධායක එම්. එම්. ටී. බණ්ඩාර යන අය මෙසේ පවසා ඇත.

ප්‍රශ්: එම චෝදනා හතර ගරු අධිකරණයට පැහැදිලි කරනවාද?.

පිː පළවැනි චෝදනාව නොසැළකිළිමත් ලෙස රාජකාරියේ යෙදීම බිල්පත් වැරදි ප්‍රමාණය සියයට එකට වඩා වැඩි වීම නොසැළකිළිමත් ලෙස රාජකාරියේ යෙදීම. දෙවන චෝදනාව බිල්පත් වැරදි නිසා නොසැළකිලිමත් ලෙස රාජකාරියේ යෙදීමෙන් සමාගමේ පාරිභෝගික සේවාවලට හානි සිදුවීම. චෝදනා අංක තුන සමාගමේ පාරිභෝගික සේවාවලට හානි පැමිණීම සිදුවීම මගින් සමාගමේ කීර්ති නාමයට හානි පැමිණවීම. චෝදනා අංක හතර සමාගමේ කීර්තිනාමයට හානි පැමිණවීම සමාගම ඔබ කෙරෙහි තබා තිබූ විශ්වාසවන්තභාවය කඩවන ලෙස ක්‍රියා කිරීම (4 සහ 5 වන පිටු)

අධිකරණයට ඉදිරිපත්ව ඇති ඉහත සඳහන් තොරතුරු සහ සාක්ෂි අනුව 1996 සිට 2000 වසර දක්වාම විවිධ අවස්ථාවන් හිදී දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ වැටුප් වර්ධක විලම්බනය කරන්නට කටයුතු කර ඇත. ඒ සෑම අවස්ථාවකම එවන් අභ්‍යන්තරික විනය ක්‍රියාමාර්ගයන් ගන්නට හේතු පාදක වී ඇති කරුණු මැනවින් පැහැදිලි කර තිබේ. එහෙයින් ඒ දක්වා නොගෙවා ඇති වැටුප් වර්ධක ලබා දෙන්නැයි නියෝග කිරීමට සාධාරණ හේතු කිසිවක් ඔප්පු කරන්නට පළමු පාර්ශ්වය සමත්ව නැත.

IV. සෙසු ආදායම් නිලධාරීනට මේවන විට ගෙවන වැටුප් හා ශ්‍රේණි මාහට ද ලබා දෙන ලෙස

V. 2020 වසරේ සිට නිලධාරීනට චක්‍රලේඛ ප්‍රකාර ගෙවන ඒ 9 ශ්‍රේණියේ වැටුප් ගෙවන ලෙස

VI. ඉහත සියලු ගෙවීම්වලට අදාළව ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවන ලෙස

ඉහත IV, V, VI යන කරුණුවලට අදාළව දක්වා ඇත්තේ පොදු කරුණු බව පෙනෙන හෙයින් ප්‍රධාන ගැටළුවට විසඳුම් ලැබෙන විට එම ගැටළුවලට විසඳුම් ලැබෙනු ඇතැයි අධිකරණය විශ්වාස කරයි.

උද්ගතව ඇති කම්කරු ආරාවුල දක්වමින් ඊට විසඳුම් සෙවීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් බේරුම්කරු වෙත දැනුම් දී ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කරමි. එහි ප්‍රමුඛ කරුණ වන්නේ 2001.01.01 දින සිට III ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට පත්කිරීමෙන් කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් යන අයට එම පත්වීම ශ්‍රේණිගතව ලබා දීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න සහ එසේනම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්නය.

2001.01.01 දින සිට බල පවත්වන පරිදි පළමු පාර්ශ්වය III ශේණියේ ආදායම් නිලධාරි තනතුරකට පත්කර ඇති බව ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුර යටතේ නිකුත් කළ 2002.07.11 ලිපියෙන් දන්වා ඇත.

එහෙත් පළමු පාර්ශ්වයට III ශ්‍රේණියේ ආදායම් නිලධාරී තනතුර ලබා දී ඇත්තේ ආදායම් නිලධාරීන්ගේ වැටුප් කේතය ඒ 5 ශ්‍රේණියට කාණ්ඩ කර තිබෙන අතරතුර බවට පළමු පාර්ශ්වය මූලික සාක්ෂි දිව්රුම් ප්‍රකාශයේ අංක 14 යටතේ දක්වා තිබේ.

එසේම පළමු පාර්ශ්වය සිය පළමු ප්‍රකාශයේ අංක 2 යටතේ මෙසේ දක්වා ඇත.

'මෙහි දෙවන පාර්ශ්වය ශ්‍රේණිගත කිරීමේදී ගබඩා සහකාර, ලිපිකරු, විගණන ලිපිකරු, පොත් තබන්නා, ආදායම් නිලධාරී ඇතුළු ලිපිකාර සමාන්තර සේවාවන් ඒ 5 ශ්‍රේණියට වර්ගීකරණය කර ඇත. එම තත්වය තහවුරු කරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඒ 1 (ඒ) ලෙසද ඒ 5 ශ්‍රේණියට අදාළ කොටස් ඒ 1(බී) ලෙසද සුවිශේෂ කරුණක් ලෙස ගොනුකර සිටියි.

මේ අනුව 2023.03.10 දින පැවති නඩු විභාගය හමුවේ අධිකරණය මෙසේ ඉල්ලා සිටියේය.

අධිකරණය

1998.03.18 පවත්වන ලද ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සම්මත කරන ලද ඉංජිනේරු නොවන සේවක කාණ්ඩ, වැටුප් ක්‍රම, තනතුරු නාම ශ්‍රේණි ආදිය දක්වන තොරතුරු පත්‍රිකාවේ පිටපතක් දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරන්න.

ඒ අනුව දිවුරුම් ප්‍රකාශයක් මගින් කරුණු ඉදිරිපත් කළ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ මානව සම්පත් විධායක මොහොට්ටි මුදියන්සේලාගේ ප්‍රදීප් බණ්ඩාර නමැති අය එකී දිවුරුම් ප්‍රකාශයේ අංක 4, 5 සහ 6 යටතේ මෙසේ දක්වා ඇත.

4. වර්ෂ 1983.09.18 වන දින සමාගම ආරම්භ කරන ලද අවස්ථාවේ සිටම සමාගමේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් විවිධ අවස්ථාවලදී සේවකයින් බඳවා ගෙන තිබුන අතර එම බඳවා ගැනීම් 1997.12.31 දින දක්වා විවිධ වැටුප් පරාසයන් යටතේ සිදුකර තිබුන බව ප්‍රකාශ කරමි.

5. ඒ අනුව සමාගමේ පැවති තනතුරු, බඳවා ගැනීමේ සුදුසුකම්, වැටුප්, ශ්‍රේණි විධිමත් කිරීමේ අවශ්‍යතාවය සමාගමට මතු වූ හෙයින් 'ටීම්ස්' ආයතනය හරහා රැකියා ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද අතර එය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1998.03.18 වන දින අනුමත කිරීමෙන් පසුව 1998.01.01 දින බලපවත්වන පරිදි සමාගම ක්‍රියාත්මක කරන ලද බව ප්‍රකාශ කරමි.

6. සමාගමේ විධායක සහ විධායක නොවන සියලු රැකියා විධිමත්ව වර්ගීකරණය කිරීමට අවස්ථාව ටීම්ස් රැකියා ඇගයීමේ වාර්තාව ( ටීම්ස් ජොබ් ඉවැලුවේශන්) හරහා සිදුවූ බව ප්‍රකාශ කරමි.

ඉදිරිපත් කරන ලද එම ලේඛනය අනුව ඒ 7, ඒ 6, ඒ 5, ඒ 4, යන ශ්‍රේණිවලට අයත් සේවක පංති පිළිබඳ විස්තර දක්නට තිබුන කාර්යාල කාර්ය සහායක වැනි කණිෂ්ඨ තනතුරක් පවා ඒ 4 යටතේ දක්වා තිබේ. III වන ශ්‍රේණියේ කිසිම තනතුරක් එම ආයතනය තුළ පවතින බවට ඉඟියක් හෝ එහි නොසඳහන්ය. කිසිදු ශ්‍රේණිගත තනතුරු විශේෂයක් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම තුළ පවතින බවට ද එහි සඳහනක් නැත.

මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පළමු පාර්ශ්වය 2001.01.01 දින සිට බලපවත්වන පරිදි ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ III වන ශ්‍රේණියේ ආදායම් නිලධාරී තනතුරකට 2002.07.11 දාතමැති ලිපියෙන් පත්කර ඇත.

2023.05.25 දින පැවති නඩු වාරයේදී සාක්ෂි ලබා දුන් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් මානව සම්පත් විධායක එම්. එම්. ටී. බණ්ඩාර මහතා අධිකරණයේ විමසීමට මෙසේ පිළිතුරු දුන්නේය.

අධිකරණය

ප්‍ර : පළමු පාර්ශ්වය ආදායම් නිලධාරි තනතුරට පත් කර තිබෙන්නේ කවදාද?

පි : 2001.01.01

ප්‍ර : ආදායම් නිලධාරි හැටියට පත්වීම් දෙනකොට දුන් වැටුප් ක්‍රමය කුමක්ද?

පි : ආදායම් නිලධාරි තුන්වන වන ශ්‍රේණිය

ප්‍ර : නමුත් 1998.01.01 දින සිට නව වැටුප් සහ තනතුරු නාමාවලිය සම්බන්ධ ලේඛනයේ තුන්වන ශ්‍රේණිය සඳහන් ආදායම් තනතුරක් නැහැ. කොහොමද එහෙනම් පත්වීමක් දුන්නෙ ඔහුට. ඔබ පිළිගන්නවද එතන යම් කිසි ප්‍රමාද දෝෂයක් සිද්දවෙලා තියනව කියල?

පි : පිළිගන්නවා.

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම පරිපාලන විධායකවරයා 1998.01.01 දින බලපවත්වන නව වැටුප් සහ තනතුරු නාමාවලියට පිටතින් III වන ශ්‍රේණියට මෙම පත්වීම ලබාදී තිබීම ප්‍රමාද දෝෂයක් බව අධිකරණය හමුවේ පිළිගනු ලැබුවද දෙවන පාර්ශ්වය මෙම නඩුවට අදාළ 2023.06.16 දාතමැති ලිඛිත දේශණය ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ 1998.01.01 දිනෙන් පසු III ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට බඳවා ගැනීම් සිදුකර තිබීම සාමාන්‍ය සහ නිදොස් ක්‍රියාවක් බවය. සමාගම පරිපාලන විධායකවරයා අධිකරණය හමුවේ දිවුරුම් දී සිදු කර ඇති කරන ප්‍රකාශයට සමාගම ඉදිරිපත් කර ඇති ලිඛිත දේශණයේ අන්තර්ගතය පටහැණිය.

ලිඛිත දේශන අංක 2 යටතේ දක්වා ඇත්තේ දෙවන පාර්ශ්වය 2001 වර්ෂය වන විට අනුගමනය කළ බඳවා ගැනීම් ප්‍රතිපත්තිවලට අනුව පළමු පාර්ශ්වය සම්බන්ධයෙන් කටයුතු කර ඇති බවය. එම ඡේදය යටතේ තවදුරටත් මෙසේද දක්වා ඇත.

පැමිණිලිකාර පාර්ශ්වය මගින් සිදුකරන ලද බිල්පත් වැරදි ප්‍රතිශතය සියයට 1 ඉක්මවූ බැවින් ආදායම් නිලධාරි තනතුරට 2001.01.01 වන තෙක් පත්වී නොමැති බවත් ඔහු ඒ වන විට පත්ව සිටි ආධුනික බිල්පත් නිලධාරි තනතුරට අදාළ වැටුප් පරිමාණයේ බවත් 1998 වර්ෂයේ 'ටීමස්' වර්ගීකරණය ක්‍රියාත්මක වන විට ඉල්ලුම්කරු ආදායම් නිලධාරි තනතුරට පත්වී නොතිබුණි. ඉල්ලුම්කරු 2001.01.01 දින ආදායම් නිලධාරි බඳවා ගැනීමේදී වැටුප් තලය වන ඒ 3 වැටුප් ශ්‍රේණියේ පිහිටුවන ලදී. ඉන් අනතුරුව ඉල්ලුම්කරුට 2016.01.01 දින සිට ඒ 5 වැටුප් ශ්‍රේණියෙන් (ආර් 21) 2019.01.01 සිට ඒ 6 (ආර් 22) වැටුප් ශ්‍රේණියෙන් ලබා දී ඇති බව තවදුරටත් ප්‍රකාශ කර සිටියි.

දැනටමත් සළකුණු කර අධිකරණයට ඉදිරිපත්කර ඇති (ආර්16) (ආර්17) (ආර්18) (ආර්19) (ආර්20) ලේඛන නිරීක්ෂණය කිරීමේදී පැහැදිළිවන්නේ 1998 වර්ෂයෙන් පසු ආදායම් නිලධාරි තනතුරට පත්කරන ලද අනෙකුත් සේවකයින්ද ආදායම් නිලධාරි III වන ශ්‍රේණියට පත් කර ඇති බවයි. ඒ අනුව ඉල්ලුම්කරු හට කිසිදු අසාධාරණයක් සිදුව නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

පළමු පාර්ශ්වයේ පත්වීම් දිනය වන 2001.01.01 දිනය මෙන්ම පත්වීම් ලිපිය නිකුත් කර ඇති 2002.07.11 යන දිනයද ටීමස් ආයතනයේ උපදෙස් ප්‍රකාර ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය 1998.03.18 දාතමින් ගන්නා ලද තීරණය ක්‍රියාත්මක කළ 1998.01.01 දිනට පසු දිනයන් වෙයි.

1998.01.01 දිනෙන් පසු මෙම වැටුප් ක්‍රම, තනතුරු කේත, ශ්‍රේණි, ආදිය වෙනසකට හෝ සංශෝධනයකට ලක්ව ඇති බවට ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම මෙම අධිකරණයට සාක්ෂි ඉදිරිපත් කර නැත. දෙවන පාර්ශ්වය 2001 වර්ෂය වන විට අනුගමනය කළ බඳවා ගැනීම් ප්‍රතිපත්තිවලට අනුව පළමු පාර්ශ්වය සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව ලිඛිත දේශණයෙන් දන්වා ඇතත් 1998.01.01 දිනෙන් පසු III ශ්‍රේණියට ආදායම් නිලධාරීන් පත්කරන්නට එකී සමාගමට අභිමතයක් පවතින බව සාධක සහිතව ඔප්පු කරන්නට දෙවන පාර්ශ්වය සමත්ව නැත. එසේ සිදුකර තිබීම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ වැටුප් ක්‍රම ශ්‍රේණි උල්ලංඝණය වන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල නියෝගවලට ඉහළින් පත්වීම් ලබා දී තිබීමක් බව පෙනීයයි.

මේ අනුව මෙම බේරුම්කරන නඩුවේ පැමිණිළිකාර පළමු පාර්ශ්වය 2001.01.01 දින සිට බල පවත්වන පරිදි III වන ශ්‍රේණියේ ආදායම් නිලධාරී තනතුරකට පත් කරන්නට දෙවන පාර්ශ්වය වන ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2002.07.11 දාතමැති ලිපිය මගින් කටයුතු කර තිබීම 1998.01.01 දින සිට බලපවත්වන ලද ආයතනගත බඳවා ගැනීම් ක්‍රියාදාමයට පටහැනි ක්‍රම විරෝධී, ක්‍රියාවක් බවත් එමගින් පළමු පාර්ශ්වයට බරපතල අගතියක් සිදුව ඇති බවත් තීරණය කරමි.

### ප්‍රදානය

එහෙයින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විමසා සිටින පරිදි

* කේ.කේ.ඩබ්.ආර්. කාරියවසම් නමැති අය 2001.01.01 දින සිට III වන ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට පත් කිරීමෙන් (එම පත්වීම ශ්‍රේණිගතව ලබා දීමෙන්) එම සේවකයාට අසාධාරණයක් සිදුව ඇති බවද

* පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කාර කේ. කේ. ඩබ්ලිව්. ආර්. කාරියවසම් නමැති අයට 2001.01.01 දිනසිට ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ 5 වන ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට පත්වීමට හිමිකම් පවතින බව ද දක්වමි.

* කේ. කේ. ඩබ්ලිව්. ආර්. කාරියවසම් නමැති අය 2001.01.01 දින සිට සත්‍ය වශයෙන්ම ඔහුට හිමි 5 වන ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට අයත් 7055 - 110 × 10 - 8155 වැටුප් ක්‍රමයේ ආරම්භක වැටුපේ පිහිටුවා මෙම ප්‍රදාන පත්‍රය ගැසට් ගත කොට මාස තුනක් ඉක්මවන්නට ප්‍රථම හිග වේතන ගෙවන ලෙස ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත නියෝග කරන අතර කේ. කේ. ඩබ්ලිව්. ආර්. කාරියවසම් නමැති අය විසින් එම ගෙවීම් ලබාගත් බවට

ඔහුගේ අත්සන සහිත ගෙවීම් පත්‍රිකාවේ සත්‍ය පිටපතක් ආයතනය විසින් කළුතර කම්කරු සහකාර කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු බවට තවදුරටත් නියෝග කරමි.

* ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් ප්‍රදානයක් සිදු නොකරන අතර ඒ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම්කිරීමට මෙම ප්‍රදානය බාධාවක් වන්නේ නැත.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**සිරි සිංගප්පුලි,**
බේරුම්කරු.

2023 ක් වූ ජුලි මස 01 වැනි දින දී ය.

EOG 08 – 0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.